# ගොරෝක් කැලේ ආච්චී

එල්. ඩබ්. විමලා මිතසේන



ගොරොක් කැලේ ආච්චීට ඒ නම පට බැඳෙන්නට ඇත්තේ ඇය ජීවත් වූ වත්ත හැඳින් වූයේ ගොරොක් ගහ කැලේ වත්ත යන නම නිසා විය හැකිය. ඇයට තිබුනේ දෙන්නට පුරුදු අතක් මිස ගන්නට හුරුවූ අතක් නොවේ. දරුවන් හත් දෙකනුගේ මවක් වුවද අවුරුදු හැටකට ආසන්න වෙද්දීත් ඇය දෑතේ වීර්යයෙන් වැඩ කළාය.

උදේ පාන්දර අවදිවන ගොරොක් කැලේ ආච්චී කුප්පි ලාම්පුව ලඟ තියාගෙන පොල් කොළ පැදුරක් හෝ ගල්ලෑහේ පැදුරක් වියුවාය. ඉතාමත් ලස්සන රටාවකින් පැදුරු වියන්නට ඇයත සම කළ හැකි කෙනෙක් ගමේ සිටියේදැයි මම නොදනිමි. ගොරොක් කැලේ ආච්චී පුරුද්දක් වශයෙන් බීඩියක් උරා බොමින් බොහෝ වැඩ කටයුතු කළයා. උදේ පහට පමණ ආප්ප ලිප ලඟ වාඩිවන ඇය මුලින්ම කරන්නේ ආප්ප කබලට දර කෑලි දමා දැල්වීමයි. ඉන් පසුව ලිප පත්තු කරන ඇය ගිනි පෙනෙල්ල මත දුම් කොළ කැබැල්ලක් තබා කර කරයි. අගල් දෙක තුනක් දිග කරදාසි කෑල්ලක් ගෙන දුම්කොළ කෑල්ල මැදට තබා සුදු බීඩිය්ක ඔතා ගනී. එය පත්තු කරගෙන දුම් උගුරු දෙක තුනක් ඇද්දාට පසුව ආප්ප පිටි හට්ටිය ලගට කරගෙන ආප්ප පිච්චීම පටන් ගනී. උදේ හය හමාර වන විට එය අවසන් කරන ඇය පොඩි කොලුවා අත එය කඩේට පිටත් කරයි.

එතැනින් නැගිටින ඇය වතුර මුට්ටියක් රත්කර වතුර ජෝගුවක් රැගෙන යන්නේ හරක් මඩුවටයි. හඳහා පැටියා දගලද්දීම උෟව වැස්සීට කට්ටු කරන ආච්චී උෟ කිරි උගුරු දෙක තුනක් බොන විට උෟව ඇද කනුවේ ගැට ගසා කිරි දෙවීම පටන් ගනී. චිරිස් ගාමින් කිරි ටික මුට්ටියට පිරෙයි. මේ වැඩ වලට ඇය මැෂිමක් වැනිය. කිරි දොවා අවසන් කරන ඇය අත් දෙක සෝදා චීත්තයේම දෙපැත්තේ පිහදා ගනී. ඒ ගෙමස්කඩ රෙද්ද ඇඳ විට්ටමට අත හරින ඇය උඩින් චීත්ත රෙද්ද ඔතාගෙන හනික දුවන්නේ කිරි කට්ටිය කපන්නය.

මුලින්ම කිරි පිහිය අතට ගන්නා ඇය පිගන් කටු කෑල්ලකින් පිහිය මුවත් තියයි. විනාඩි දෙක තුනක් පිහි තුඩේ පිගන් කටු කෑල්ල අතුල්ලන ඇය ඔට්ටුපාලු කොත්තුවද ගෙන සිදුරංගල කන්ද නගින්නේ බොහෝම කඩිසර ගමනිනි. උදේ උරපු බීඩිය හැරුණුකොට කිසිම ආහාරයක් ගත් බවක් මා නම් දැක නැත. දවල් දහයට පමණ හිස් අරක්කු බෝතලයකට තේ කහට පුරවාගෙන පත්තර කරදාසි මූඩියකින් බෝතලයේ කට වසාගෙන පත්තර කඩදාසියකට සීනි පොඩ්ඩක් ඔතාගෙන මම දවාලට ආච්චීට තේ ගෙන ගිය හැටි මතකය. තෙරනා අක්කේ, නැපෝ අයියේ, සුමනාවතී වශයෙන් නම් කියමින් අඬගසා තේ බෝතලය අවට කට්ටිවල කිරි කපන අයටත් බෙදා දෙයි. පෙරන් ගා සුද්ද කරන ලද පොල් කටු දෙකක් එසඳහාම ගසක් යට මුනින් නමා ඇත. තේ කහට අගුරක් පොල් කට්ටෙන් කටට හලා ගන්නා ඇය සීනි පොට්ඩක්ද කටට විසිකර ගනී. දෑත එකට ගසා සීනි ටික ගසා දමන ඇය "වැකෑළුවක් වගේ නැපෝ අයියේ, ඉක්මනට අකුලමු" කියා ගිසින් ගස ලගට ගොස් කිරි අකුලන්නේ මැෂිමක් ආකාරයෙනි. සුමානයකට සැරයක් විතර ඔට්ටුපාලු බෝලයක් ගෙදර ගෙන යන්නට ඇය හොර රහසේ කැකිල්ල පදුරක් යට සගවා තබයි. අහුලාගත් දර මිටිය මැදට තබා ඔට්ටුපාලු ගුලිය බැඳ ගන්නා ඇය කැකිල්ල කොළ ටිකක් උදුරා ගුලියක් කර එයහ්ිසට තබා දර මිටියක් බැඳගෙන පහල බසින්නේ කිරි බාල්දිය ස්ටෝරුවට බාර දුන්නාට පසුවය.

ගෙදර ආපසු ලොකු කෙල්ල මොනවා හරි තම්බා තිබෙන බව ඇය දනී. හත් දවසක් හාමතේ සිටියත් ගොරොක් කැලේ ආච්චී නම් තමන්ගේ බත් පත ගෙදරට පැමිණි කෙනෙකුට නොදී අරින්නේ කළාතුරකිනි.

සමහර අය ගොරොක් කැලේ ආච්චිට මිලි ආච්චි කියා කිව්වත් ප්‍රසිද්ධ නම වුනේ ගොරොක් කැලේ ආච්චී යන නමයි. ආච්චී කොණ්ඩය කඩා දැමූ විට විලිඹට මඳක් උඩට වැටෙන සේ දිග කොණ්ඩය, වට දෙක තුනක් අතේ ඔතා කොණ්ඩය බැඳ ගැනීම ආච්චීගේ සිරිතය. නෑදෑයන් ආච්චී සුදු අම්මා කියනවාද මම අසා ඇත්තෙමි. ඇත්තටම ආච්චී තරුණ කාලයේදී පංච කල්‍යාණියක්ව ඉන්නට ඇත.

ගමේ වින්නඹු අම්මාගේ ද චරිතය කළේද ඇයයි. " අනේ මිලි අක්කේ, අපේ උන්දැට හරී අමාරුයි එනවද? කවුරු හරි ඇවිල්ලා කථා කළහම "ආ පෝයත් ලගයි නේද? හෙට වෙනකොට ළමයා හම්බුවෙයි. මම එන්නම්, කොලපත් ගොට්ටක් එහෙම හදලා තියාපන්කො. කොහොඹ තෙල් ටිකක් හෙම ලෑස්ති කරලා තියපන්. ඒකිගේ අම්මා එහෙමත් ඇතිනේ." එහෙම කියන ඇයි ලහි ලහියේ මල්ලත් රැගෙන කියූ තැනට යන්නේ නිමේෂයෙනි. ඒ පන් මල්ලේ තිබුනේ මොනවාදැයි මම නොදනිමි. එහෙත් ඒ මල්ලේ කළු ගැහැණු කතුරක් තිබෙන බව නම් මම දැන සිටියෙමි. ගමන පිටත් වන්නට පෙර නටන වතුර බේසමකට ඔබා කතුර තම්බාගෙන යනවා මම දැක ඇත්තෙමි.

ගෙදර දොරේ වැඩ මොනතරම් පාළු වුනත් ගිය කාරිය අවසන් කර මිස ගෙදර එන සිරිතක් ගොරොක් කැලේ ආච්චීට නොවීය. "හරි අමාරු වුනානෙ සේතන්ගෙ ගෑණිට. මම නොහිටින්න මෙදා පාර බේරගන්න බැරි වෙනවා. ළමයා තට්ටමෙන් ආවේ. යන්තම් මම අතදාලා තමයි හරවලා ගත්තේ. ඇය මේවා කියන්නේ විශේෂඥ වෛද්‍යවරයකුගේ විලාසයෙනි. මම ඔය ගත්ත දාහත්වෙනි ළමයා. මෙතෙක් කල් එකම ළමයෙක්වත් මැරෙන්න දුන්නේ නෑ. ආච්චී පුරසාරම් කියන්නේ එහෙමයි. ඒත් ඒක පුරසාරමක් නොවෙයි. මේවාට ආච්චී ශත පහක් වත් අය කළේ නැත. "අනේ මම උඹලගෙන් සල්ලි බලාගෙන ආවා නොවෙයි. මං මේවා කරන්නේ පිං පතාගෙන. මට අලුත මෙළෝ එළිය දැක්ක පැටියගේ මූණ දැක්කම ඔක්කොම හමාරයි.

ආච්චී ඒ විතරක් නෙමෙයි, යන්තර මන්තර ගුරුකම් වැඩක් කළා. ඒවා කාගෙන් කොහොම ඉගෙන ගත්තද කියල මම දන්නේ නෑ. ආච්චී හය පාස් වෙනකල් ඉස්කෝලේ ගියාලු. ආච්චිට හොදට නම ලියලා අත්සන ගහන්න පුළුවන්. ඔලුවේ කැක්කුමට, බඩේ කැක්කුමට හා දත් කැක්කුමට ආච්චි තෙල් දෙහි වගේ දේවල් මතුරලා දෙනවා.

හැමදාම හවසට ගොරෝක්කැලේ ආච්චීලගේ ගෙදරට කීපදෙනෙක්ම එකතු වෙනවා. ඒ වෙලාවට වැලිකොස් ඇට තම්බනවා, නැත්නම් කලටි පොල් කඩලා කොස් තම්බලා කනවා. ඒ මොකුත් නැති දාට වෙල් ගහල උදුරාගෙන ඇවිල්ලා තම්බලා, ගම්මිරිස් ලුණු දාලා හදන වෙල් ගහල හැලිය පැය භාගයක් යනකොට කොහෝ ගියාද දන්නේ නැහැ. කට කහනවට ආච්චී රස්නෙ පිටින්ම තේ කහට හදල දෙනවා.

ආච්චිගේ තවත් ඉතා ප්‍රසිද්ධ වෙද කමක් තිබුණා, දත් පණුවෝ හැලීම. ඒකට කොහොමත් දවසකට එක්කෙනෙක්වත් ආච්චිලාගේ ගෙදරට ආවා. මමත් පොඩි එකෙක් විදියට ආච්චිගේ මේ දත් පණුවෝ හැලිල්ල බලාගෙන හිටියා. ආච්චි මේකට පාවිච්චි කලේ පොල් කටුවක් හිල් කරලා ඒකට ගහලා තිබුණ බට කෑල්ලකුයි, තව පරණ මන්න තලයකුයි. මන්න තලය ලිපට දාලා රත් කරනවා. ඉන් පස්සේ කටුවැල් බටු ටිකකුයි කොහොඹ තෙල් ටිකකුයි අරගෙන ගිනියම් වෙච්ච මන්න තලේ උඩට දානවා. එතකොට "චිරි චිරි" ගාලා එතනින් දුම් නගිනවා. අර බට කෝටුව ගහපු පොල් කට්ටෙන් ඒක වහලා දුම් ටික කටට උරනවා. ටිකක වෙලා දුම් ටික කටේ තියාගෙන ඉදලා ආපහු පහලට පිඹිනවා. එහෙම දෙතුන් වතාවක් කලාට පස්සේ ආච්චී මන්න තලේට එබිල බලනවා." ආහ්.... ඔය පණුවෝ හතර පස්දෙනෙක්ම වැටිලා ඉන්නේ", ආච්චි මන්න තලේ උඩ ඉන්න සුදු පාට කිරි පණුවෝ වගේ පණුවෝ පෙන්නනවා. ඒත් කාලයක් යනකොට තමයි මට තේරුණේ ආච්චී ඒ පණුවෝ කියලා පෙන්නුවේ කටුවැල් බටු ඇටවල පිපිරුණු මදය බව. ආච්චී නම් තාමත් විශ්වාස කරනවා ඇත්තේ ඒ දත් පණුවෝ කියලා තමයි. මේවගේ පුංචි පුංචි වෙදකම් ගොඩාක් ආච්චී කළා.

වැස්සියන්ට පැටව් හම්බවෙන්න අමාරු වුනාමත් ආච්චී පොඩි වෙදකමක් කළා. පෝට වැල් අරන් කොටලා ඉස්ම බෝතලයකට දාලා වැස්සිට පෙව්ව-ාම අමාරුවක් නැතුව පැටියා හම්බු වුනා. ඒ විතරක් නෙමෙයි, ආච්චී හරක් හණ ගහලා පණුවෝ දැම්මගමන් පණුවෝ හැලෙන්න කපුරු පෙතියි, දුම්කොළයි අඹරලා ඉහඳ ගෙඩියට ඇතුළ් කළා. උලුක්කුවක් වුනාම උලුක්කුව නැති වෙන්න මොනවද ආච්චී කළා. ආච්චී කියනවා එයා නිවුන් කෙනෙක්ලු. නිවුන්නු කෙනෙක් පෑගුවම ඒක නැතිවෙලා යනවලු.

හැමදාම හවසට ගොරොක්කැලේ ආච්චීලගේ ගෙදරට කීපදෙනෙක්ම එකතු වෙනවා. ඒ වෙලාවට වැලිකොස් ඇට තම්බනවා, නැත්නම් කලටි පොල් කඩලා කොස් තම්බලා කනවා. ඒ මොකුත් නැති දාට වෙල් ගහල උදුරාගෙන ඇවිල්ලා තම්බලා, ගම්මිරිස් ලුණු දාලා හදන වෙල් ගහල හැලිය පැය භාගයක් යනකොට කොහෝ ගියාද දන්නේ නැහැ. කට කහනවට ආච්චී රස්නෙ පිටින්ම තේ කහට හදල දෙනවා.

ගොරොක්කැලේ ආච්චී කැවුම් කොකිස් ආස්මී හදන්නත් හරි හපනා. ඕවා විවේක තියන වෙලාවට හදලා අපි කාටත් කන්න දෙන්නේ කිසිම ලෝභකමක් නැතුව. "මට ඉතින් අපේ එවුන්ට පිට එවුන්ය කියලා ගානක් නෑ පුතේ, කාපල්ලා".

කිරි අම්මලාගේ දානේ ගෙවල්වල ඇප නිදහස් කරන්න යන්නෙත් ගොරොක්කැලේ ආච්චී තමයි. පත්තිනි හෑල්ල සද්දෙට කියනවා. "කිරි අම්මාවරු සත්දෙන බාලේ", ආච්චීගේ කට හඬ මට අහෙනවා වගේ. කිරි අම්මාගේ දානේ ගෙදරින් ගේන කෑම පොදියත් මග දිගට ඉන්න ගෙවල්වල පොඩි උන්ට දීලා තමයි ඉතුරු ටික ගෙදර ගෙනාවේ.

ගොරොක්කැලේ මහ ගෙදර පල දෙකට තිබුණු පරණ ගේ කඩලා තට්ටු දෙකට අළුත් ගෙයක් හදලා. ආච්චී මැරිලා හෙටට අවුරුදු හතලිහක් වෙනවලු. දානේ දෙන්න ගජරාමෙට ලෑස්ති වෙනවා. ඒ අතරින් දැනුත් මට පේන්නේ ගොරොක්කැලේ ආච්චී එහාට මෙහාට යන හැටි....


